# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2001 අංක 2 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2001 මාර්තු මස 21වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2001 මාර්තු මස 23 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 3.50 යි.

## 2001 අංක 2 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධිත) පනත

[සහතිකය සටහන් කලේ 2001 මාර්තු මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 55/99.

**1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2001 අංක 2 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1997 අංක 16 දරන පනතින් අවසන් වරට සංශෝධිත, 1983 අංක 24 දරන වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් පනතේ 3 වන වගන්තියේ (6) වන උපවගන්තිය ඉවත්කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :— 1983 අංක 24 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(6) (අ) මේ උපවගන්තියේ කාර්ය සඳහා, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලබන යම් දිනයකට පෙර, නියමිත දිනයේ දී ධූරය දරන නිලධාරිනියක් විසින්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක් වීමට තීරණය කළ හැකි ය. මේ උපවගන්තිය ක්‍රියාත්මක වීමේ දිනයට පෙරාතුව එවැනි යම් නිලධාරිනියක් මියගොස් ඇති අවස්ථාවක හෝ ඉහත කී පරිදි දායිකාවක වීමට තීරණය නොකර මේ උපවගන්තියේ කාර්ය සඳහා නියම කරන ලද දිනයට පෙර මියයන අවස්ථාවක, ඒ මරණයෙන් පසු ඇගේ ස්වාමිපුරුෂයා හෝ දරුවකු හෝ ස්වාමිපුරුෂයා සහ දරුවකු හෝ ස්වාමිපුරුෂයා සහ දරුවන් ජීවත්ව සිටින්නේ නම්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට ඇය තීරණය කොට තිබුණු ලෙස සලකනු ලැබිය යුතු ය:

(ආ) මේ උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කරනු ලැබූ යම් තැනැත්තෙක් හෝ මේ උපවගන්තිය යටතේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායිකාවක වීමට තීරණය කොට තිබුණු ලෙස සලකනු ලබන තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විට හෝ ඒ මියගිය තැනැත්තාගේ

2-H 010701-4,400 (2001/02)

මුදලය අද්මිනිස්ත්‍රාසි කරන තැනැත්තා විසින්, නියමිත දිනයෙන් ආරම්භව, අවස්ථාවෝචිත පරිදි, එසේ තීරණය කරනු ලැබූ දිනය, විශ්‍රාම ගනු ලැබූ දිනය හෝ මරණය සිදු වූ දිනය තෙක් වූ කාලසීමාව සඳහා වූ සියලු හිඟ දායක මුදල්, ඒ මත වර්ෂයකට සියයට හතරක අනුපාතය අනුව වූ වැල් පොළිය ද සමඟ, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් වාරිකවලින්, ගෙවනු ලැබිය යුතු ය ;

(ඇ) දායිකාවකට හෝ මියගිය දායිකාවකගේ මුදලය අද්මිනිස්ත්‍රාසි කරන තැනැත්තකුට හෝ හිඟ දායක මුදල් ගෙවීමට නොහැකි වන අවස්ථාවක, ඒ දායිකාවගේ වැන්දඹු පුරුෂයාට හෝ අනත්දරුවන්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුපෙන් ඒ හිඟ දායක මුදල්, අධ්‍යක්ෂවරයා විසින් තීරණය කරනු ලබන යම් වාරිකවලින් අයකර ගනු ලැබිය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.